පාතහේවාහැට ප්‍රාදේශීය සභාව
මහනුවර දිස්ත්‍රික්කය

----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

-------------------------------

2017 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2018 මාර්තු 29 දින විගණනයට ඉදිරිපත් කර තිබූ අතර එම මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2018 ජූනි 14 දින සභාපතිවරයාට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය

-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට පාතහේවාහැට ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

(අ) ස්ථාවර වත්කම් ලේඛනයේ සටහන් කර ඇති ඉඩම් කැබලි 62 ක වටිනාකම් හඳුනා ගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) ඉන්ධන ලබා ගැනීම වෙනුවෙන් ඉන්ධන පිරවුම් හළකට තැන්පතුවක් වශයෙන් ගෙවා ඇති රු.50,000 ක මුදල පෙර ගෙවුම් යටතේ ගිණුම්ගත කර තිබිය දී, විවිධ තැන්පත් ගිණුමේ බැර ශේෂයක් ලෙස ද ගිණුම්ගත කර තිබුණි.

1.3.2 නොසැසඳුණු ගිණුම්

---------------------

ගිණුම් විෂයන් 02 කට අදාළ පාලන ගිණුම් අනුව, ශේෂයන්ගේ එකතුව රු.9,760,631 ක් වුවත්, උපයෝගී ලේඛන අනුව එම ශේෂයන්ගේ එකතුව රු.9,626,923 ක් වූයෙන්, රු.291,362 ක නොසැසඳීමක් අනාවරණය විය.

1.3.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

----------------------------------

(අ) ලැබිය යුතු ගිණුම්

------------------

2017 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ගිණුම් ශේෂ 08 ක එකතු වටිනාකම රු.85,862,288 ක් වූ අතර, එයින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂයන්වල එකතුව රු.7,821,869 ක් විය. අවුරුදු 01 ත් 05 ත් අතර කාලයකට අදාළ හිඟ ශේෂයන් හි එකතුව රු.35,123,508 ක් වූ අතර, 2018 මැයි 11 දිනට රු.79,894,013 ක ශේෂයක් තවදුරටත් අය විය යුතුව පැවතුණි.

(ආ) ගෙවිය යුතු ගිණුම්

-------------------

2017 දෙසැම්බර් 31 දිනට රු.23,660,846 ක් වූ ගෙවිය යුතු ගිණුම් ශේෂ 02 ක එකතු වටිනාකමින් අවුරුදු 05 ක කාලයක් ඉක්මවා තිබූ ශේෂවල එකතුව රු.15,000 ක් වූ අතර, අවුරුදු 01 ත් 05 ත් අතර කාලයකට අදාළ හිඟ ශේෂවල එකතුව රු.2,563,204 ක් වී තිබුණි. 2018 මැයි 11 දිනට රු.8,971,064 ක ශේෂයක් තවදුරටත් ගෙවිය යුතුව පැවතුණි.

1.3.4 විගණනය සඳහා අවශ්‍ය ලිඛිත සාක්ෂි නොමැති වීම

-----------------------------------------------------

අවශ්‍ය තොරතුරු ඉදිරිපත් නොකිරීම නිසා, එකතුව රු.30,963,152 ක් වූ ගිණුම් විෂයන් 03 ක් විගණනයේ දී සතුටුදායක ලෙස සත්‍යාපනය කිරීමට නොහැකි විය.

1.3.5 අනුකූල නොවීම්

------------------

නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

| | | නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|---|
| | | | රු. | |
| (අ) | | 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වගන්තිය | -- | සභා බල ප්‍රදේශය තුළ පිහිටි සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි හෝටල් 10 කින් ආදායම අනුව සියයට 01 ක ගාස්තු අය කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) | | 1988 ප්‍රාදේශීය සභා (මූල්‍ය හා පරිපාලන) රීති | | |
| | (i) | අංක 59, 61 හා 67 | -- | සභා බල ප්‍රදේශය තුළ කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීය ස්ථාන පිළිබඳව සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. තවද ඒ සඳහා ලේඛන නඩත්තු කර නොතිබුණි. |
| | (ii) | 218 | -- | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලි සම්බන්ධව වාර්ෂික සමීක්ෂණයක් සිදු කර නොතිබුණි. |
| (ඇ) | | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 571(3) | 407,220 | තාවකාලිකව තැන්පතු ගිණුමේ රඳවා ගෙන තිබූ තැන්පතු අවස්ථාවෝචිතව නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වුවත්, 2012 - 2016 කාල පරිච්ඡේදයේ අවස්ථා 43 කට අදාල තැන්පතු, තැන්පත් ගිණුමේ රඳවා ගෙන තිබුණි. |
| (ඈ) | | 2016 මාර්තු 17 දිනැති අංක 2016/3 දරන පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේඛයේ | -- | යටත් පිරිසෙන් වසර 05 කට වරක්වත් කඩ කාමරවල තක්සේරුගත කුලිය සංශෝධනය |

| | |
|---|---|
| 05(I) | කර, සභාවට ආදායම් අය කර ගැනීමට කටයුතු කළ යුතු වුව ද, 2004 හා 2006 වර්ෂවල සිදු කරනු ලැබූ තක්සේරු පදනම් කර ගනිමින්, ගලහා හා දෙල්තොට පිහිටි කඩ කාමරවලින් සමාලෝචිත වර්ෂය සඳහා ද කුලී අය කර තිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය
----------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල
-------------

ඉදිරිපත් කරන ලද සංශෝධිත මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.25,037,388 ක් වූ අතර, ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.33,941,501 ක් විය.

2.2 ආදායම් පරිපාලනය
---------------------

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්
--------------------------------------------------------------------------------

**සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.**

| | ආදායම් ප්‍රභවය | 2017 ඇස්තමේන්තුගත ආදායම | 2017 බිල් කළ ආදායම | 2017 රැස් කළ ආදායම | 2017 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය | 2016 ඇස්තමේන්තුගත ආදායම | 2016 බිල් කළ ආදායම | 2016 රැස් කළ ආදායම | 2016 දෙසැම්බර් 31 දිනට මුළු හිඟය |
|---|---|---|---|---|---|---|---|---|---|
| | | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| (i) | වරිපනම් හා බදු | 11,354,482 | 10,061,875 | 8,466,490 | 22,728,124 | 3,253,822 | 10,030,837 | 6,699,858 | 21,023,046 |
| (ii) | කුලී | 3,729,356 | 3,921,109 | 4,315,015 | 880,610 | 4,523,935 | 4,256,548 | 3,487,853 | 1,160,531 |
| (iii) | බලපත්‍ර ගාස්තු | 5,333,250 | 2,404,587 | 2,404,587 | -- | 3,082,855 | 2,416,703 | 2,416,703 | -- |
| (iv) | වෙනත් ආදායම් | 29,099,540 | 28,007,204 | 13,758,995 | 50,296,617 | 34,550,347 | 30,688,304 | 14,835,844 | 36,483,774 |
| | එකතුව | 49,516,628 | 44,394,775 | 28,945,087 | 73,905,351 | 45,410,959 | 47,392,392 | 27,440,258 | 58,667,351 |

**2.2.2 ආදායම් රැස් කිරීමේ කාර්යසාධනය**
**-----------------------------------------**

**සමස්ථ ආදායම් ප්‍රභවයන්ගෙන් 2016 දෙසැම්බර් 31 දිනට පැවති හිඟය රු.58,667,351 ක් වූ අතර, සමාලෝචිත වර්ෂයේ අවසාන දිනට එම අගය රු.73,905,351 ක් වීම හේතුවෙන්, හිඟ ආදායම්වල වර්ධනය සියයට 26 ක් විය.**

**2.2.3 වරිපනම් හා බදු**
**------------------**

**(අ) වරිපනම්**
**-----------**

**2017 ජනවාරි 01 දිනට හිඟ වරිපනම් ශේෂය රු.5,635,445 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.2,634,360 ක් විය. 2017 දෙසැම්බර් 31 දින වන විට හිඟයෙන් හා**

බිල් කිරීමෙන් අය කර තිබුණේ පිළිවෙළින් රු.1,283,099 ක් හා රු.1,859,942 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 23 ක් සහ සියයට 71 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දිනට රු.5,126,764 ක හිඟ ශේෂයක් පැවතිණි.

(ආ) අක්කර බදු

--------------

2017 ජනවාරි 01 දිනට හිඟ අක්කර බදු ශේෂය රු.1,156,129 ක් වූ අතර, 2017 දෙසැම්බර් 31 දින දක්වා බිල් කිරීම් රු.50,981 ක් විය. 2017 දෙසැම්බර් 31 දින වන විට හිඟයෙන් කිසිදු මුදලක් අය කර ගෙන නොතිබූ අතර, බිල් කිරීමෙන් අය කර ගෙන තිබුණේ රු.205 ක් පමණි. මේ අනුව, ආදායම් අය කර ගැනීම ඉතා දුර්වල මට්ටමක පැවති අතර, 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 158 වගන්තිය ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.2.4 කුලී

-----

2017 ජනවාරි 01 දිනට හිඟ කඩ කුලී ශේෂය රු.430,696 ක් වූ අතර, 2017 වර්ෂයේ බිල් කිරීම් රු.1,634,063 ක් විය. 2017 දෙසැම්බර් 31 දින වන විට හිඟයෙන් හා බිල් කිරීම්වලින් අය කර තිබුණේ පිළිවෙළින් රු.69,870 ක් හා රු.1,256,203 ක් පමණි. මෙය ප්‍රතිශතයක් ලෙස සියයට 16 ක් හා සියයට 77 ක් විය. 2017 දෙසැම්බර් 31 දිනට රු.738.686 ක හිඟ කඩ කුලී ශේෂයක් පැවති අතර, 2018 මැයි 11 දින වන විට රු.320,804 ක් තවදුරටත් අය විය යුතුව තිබුණි.

2.2.5 බලපත්‍ර ගාස්තු

---------------

2017 නොවැම්බර් 24 දින නියැදියක් ලෙස වෙළඳ ව්‍යාපාර 28 ක් පරීක්ෂා කිරීමේ දී ඉන් වෙළඳ ව්‍යාපාර 20 ක් සමාලෝචිත වර්ෂය සඳහා වෙළඳ බලපත්‍ර ලබා ගෙන නොතිබුණි.

2.2.6 උසාවි දඩ හා මුද්දර ගාස්තු

--------------------------

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් හා අනෙකුත් බලධාරීන්ගෙන් 2017 දෙසැම්බර් 31 දිනට උසාවි දඩ රු.930,331 ක් හා මුද්දර ගාස්තු රු.47,380,986 ක් විය.

3. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

--------------------------------

(අ) වර්ෂ 03 කට අධික කාලයක සිට ඉදිරියට ගෙන එමින් පවතින රු.12,806 ක අත්තිකාරම් ශේෂයක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2012 වර්ෂයේ දී සිදු කරනු ලැබූ වාහන අලුත්වැඩියාවක් වෙනුවෙන් පළාත් මාර්ග සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු රු.361,694 ක මුදල සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් ගෙවීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) 1985 අගෝස්තු මස දින රහිතව රු.125 ක මාසික කුලී පදනම මත තලාතුඔය, ගුරුදෙණිය පාරේ පදිංචි පුද්ගලයෙකුට සිල්ලර වෙළඳාම සඳහා බදු පදනම මත අංක 03 කඩ කාමරය ලබා දී රු.227,180 ක කුලී නොගෙවීම හේතුවෙන් 2014 වර්ෂයේ ගිවිසුම අවසන් කර මුද්‍රා තබා තිබුණි. මෙම කටයුතු නිරවුල් කර ගැනීමකින් තොරව වසා දමා ඇති එම කඩ කාමරය ඉදිරිපිට තාවකාලිකව තහඩු ආවරණ සහිත අලෙවි සැලක් කර ගෙන යාමට වෙනත් පුද්ගලයෙකුට

ප්‍රාදේශීය සභාව අවිධිමත් ලෙස ඉඩකඩ ලබා දී තිබුණි. 1985 වර්ෂයේ දී බදු ලබා දී ඇති කඩ කාමරය පිහිටි ඉඩම සම්බන්ධව සභාවට ඇති නීත්‍යානුකූල අයිතිය සනාථ කිරීමට හැකි ඔප්පුවක් හෝ පැවරුම් නියෝගයක් සභාව සතුව නොතිබුණි.

3.2 මානව සම්පත් කළමනාකරණය
-----------------------------------

(අ) 2017 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත සේවක සංඛ්‍යාව හා තථ්‍ය සේවක සංඛ්‍යාව අතර තනතුරු 48 ක පුරප්පාඩුවක් හා තනතුරු 01 ක අතිරික්තයක් පැවතුණි.

(ආ) ආදායම් පරීක්ෂකවරයෙකු සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට ඔක්තෝබර් දක්වා කාලයට අදාළ ඉදිරි වැඩසටහන් හා කළ වැඩසටහන් කිසිවක් ලබා දී නොතිබුණි.

3.3 මෙහෙයුම් අකාර්යක්ෂමතා
----------------------------

(අ) වසර 05 කට වරක් වරිපනම් බදු නව තක්සේරුවක් කර බදු අය කළ යුතු වුවත්, සභාව විසින් 2008 වර්ෂයේ සිදු කරනු ලැබූ තක්සේරුව පදනම් කර ගෙන 2017 වර්ෂයට ද වරිපනම් බදු අය කර තිබුණි.

(ආ) දෙල්තොට පොදු වෙළඳ පොළේ කඩ කාමර 12 ක් බදු ගිවිසුම්වලින් තොරව 2008 වර්ෂයේ සිට බාහිර පාර්ශවයන්ට ව්‍යාපාර කටයුතු සඳහා පවරා දී තිබූ අතර, කඩ කාමර 14 ක බදු ගිවිසුම්වල සභාපතිවරයා හෝ ලේකම්වරයා අත්සන් තබා නොතිබුණි.

(ඇ) 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 78(1) වගන්තිය ප්‍රකාරව සභාව පොදු මහජන සෞඛ්‍ය අධිකාරිය වුවත්, පුද්ගලයින් 3000 කට පමණ ජල සැපයුම් ලබා දී තිබූ ජල යෝජනා ක්‍රම 07 ක ජලය පෙරහන් කිරීමක් හා පිරිපහදුවක් සිදු නොකර ජලයට ක්ලෝරීන් යෙදීම පමණක් සිදු කර ජලය බෙදා හරිමින් තිබුණි.

3.4 වත්කම් කළමනාකරණය
------------------------------

වාහන උපයෝජනය
----------------------

සභාව සතු කැබ් රථයක් 2015 මැයි 14 දින අනතුරකට ලක් වී අලුත්වැඩියා කටයුතු සඳහා රු.103,188 ක් වැය කර තිබුණි. 2017 නොවැම්බර් 24 දින වන විටත් මේ සම්බන්ධයෙන් මු.රෙ.104(4) ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

3.5 ප්‍රසම්පාදනය
---------------

3.5.1 ප්‍රසම්පාදන සැලැස්ම
----------------------

සමාලෝචිත වර්ෂයේ දී රු.84,537,779 ක ප්‍රාග්ධන වියදම් සභාව දරා ඇති නමුත්, සඳහා ප්‍රසම්පාදන සැලැස්මක් සකස් කර නොතිබුණි.

**3.5.2 සැපයීම් හා සේවා**

-------------------

පුස්තකාල පොත් මිලදී ගැනීමට අදාලව මිල ගණන් කැඳවීමේ දී, මිල ගණන් ඉදිරිපත් කර නොතිබූ ආයතනයකින් රු.85,000 ක් වටිනා පොත් මිල දී ගෙන තිබුණි.

**4. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය**

-----------------------------------

**4.1 අයවැය පාලනය**

-----------------

සමාලෝචිත වර්ෂය සඳහා පිළියෙල කර තිබූ අයවැය ලේඛනයට අනුව, ඇස්තමේන්තුගත ආදායම් හා වියදම්, තථ්‍ය ආදායම් හා වියදම් අතර ආදායම් විෂයන් 03 ක සියයට 22 සිට සියයට 40 දක්වා ද, වියදම් විෂයන් 05 ක සියයට 29 සිට සියයට 137 ක් දක්වා ද විචලනයන් නිරීක්ෂණය වූ බැවින්, අයවැය ලේඛනය ඵලදායී පාලන කාරකයක් වශයෙන් යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

**4.2 අභ්‍යන්තර විගණනය**

----------------------

අභ්‍යන්තර විගණන කටයුතුවලට පරිබාහිර කටයුතු ද අභ්‍යන්තර විගණකට පවරා තිබූ බැවින්, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කිරීමට නොහැකි වී තිබූ අතර, අභ්‍යන්තර විගණන වාර්තාවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි.

**4.3 සංයුක්ත සැලැස්ම**

--------------------

සමාලෝචිත වර්ෂයට අදාළව සංයුක්ත සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

**5. පද්ධති හා පාලන**

-----------------

විගණනයේ දී නිරීක්ෂණය වූ අඩුපාඩු වරින් වර සභාවේ අවධානයට යොමු කර ඇති අතර, පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.

| | පද්ධතිය | | අඩුපාඩුව |
|---|---|---|---|
| | --------- | | ----------- |
| (අ) | ආදායම් පරිපාලනය | i. | ආදායම් අය කර ගැනීම දුර්වල වීම |
| | | ii. | නව තක්සේරුවත් මත කඩ කාමර කුලී අය නොකිරීම |
| | | iii. | කර්මාන්ත, වෙළඳ ව්‍යාපාර හා වෘත්තීය ආයතන සමීක්ෂණයක් සිදු නොකිරීම |
| (ආ) | වත්කම් කළමනාකරණය | i. | ස්ථාවර වත්කම් ලේඛනය අවිධිමත් වීම |
| | | ii. | බොහෝ ඉඩම්වල ඔප්පු හෝ පැවරුම් නියෝග ලබා ගැනීමට කටයුතු නොකිරීම |
| | | iii. | ඉඩම් සමීක්ෂණයක් සිදු නොකිරීම |
| (ඇ) | ණයගැතියන් හා ණයහිමියන් | i. | ලේඛන අවිධිමත් වීම |
| | | ii. | කර්මාන්ත ණයගැති මුදල් අය කර ගැනීමට කටයුතු නොකිරීම |
| (ඈ) | විවිධ තැන්පතු | i. | කර්මාන්ත අත රැඳවුම් දිගු කාලයක් රඳවා තබා ගැනීම |
| | | ii. | ආපසු ගෙවිය යුතු තැන්පතු පිළිබඳව සොයා බලා කටයුතු නොකිරීම |